නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- මිනිසෙකු සිටගනිමින් පාවහන් පැළඳීම තහනම් කළහ.

ජාබිර් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- මිනිසෙකු සිටගනිමින් පාවහන් පැළඳීම තහනම්
කළහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ සිටගත් තත්ත්වයේ පාවහන් පැළඳීමේ තහනම පනවා ඇත. හේතුව වාඩි වී එය පැළඳීම පහසු වන බැවිනි. මෙය, පාදයට පැළදීමේදී යම් ක්රියාවලියක අවශ්යතාවක් ඇති පාවහන් යුවලක් වූ විටෙක විශේෂ වූ නීතියකි. මිනිසා සිටගෙන පාවහන් පළදින්නේ නම්, පාවහන් යුවල පැළඳීමේ යම් ක්රියාවලියක් ඇත්නම් ඇතැම් විට එය ක්රමවත්ව පළඳින්නට තම පාදය ඔසවන විට වැටෙන්නට බලන බැවිනි. වර්තමානයේ අප දැන හඳුනන පාවහන් සිටගත් තත්ත්වයේ පැළඳීමෙහි වරදක් නැත. එය තහනම් ගණයට ඇතුළත් නොවේ. වර්තමාන භාවිතයේ ඇති පාවහන් වාඩිවී පැළඳීමේ අවශ්යතාවකින් තොරවූ, එය පහසුවෙන් පළදින්නටත් ගලවන්නටත් හැකි අයුරින් පිහිටා ඇත. ආගමික නීතියේ කාන්තාවන් හා පිරිමින් අතර කිසිදු වෙනසක් නැත. විශේෂයෙන් පෙන්වා දෙන ලද කරුණක හැර ෂරීආ නීතිය තුළ කාන්තාවන් හා පිරිමින් අතර වෙනසක් නොපවතී. නමුත් මෙහිදී මෙම හදීසය පිරිමින්ට පමණක් වෙන් වූවකි. හේතුව නිවසින් බොහෝ විට බැහැරට යන්නේ පිරිමින්ය. එබැවින් මෙය මෙනෙහි කිරීම ඔවුනට විශේෂිත වූවකි. රියාලුස් සාලිහීන්හි විවරණය: ඉබ්නු උසෙය්මිය්යීන් (6/388) මීට අමතවද සඳහන් කොට ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/8944